# එල් එච් මෙත්තානන්ද සමරුව

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ හිටපු සභාපති

## එල් එච් මෙත්තානන්ද මැතිතුමා

ලංකා මාතාවට ජනිත වුයේ දහනමවැනි සියවසේ දෙවන භාගයේදී මෙරට හටගත් බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඉතා සාර්ථකව දියත් වී අගනා ප්‍රතිඵල ලබා තිබුණු අවධියකදිය බ්‍රිතාන්‍ය පාලකයන් බුද්ධාගමට හා බෞද්ධ අධ්‍යාපනයට ලබා දුන් පහත් තත්ත්වය හේතුකොට ගෙන දහනම වැනි සියවසේ දෙවන භාගයේදී හටගත් බෞද්ධ පුනරුද ව්‍යාපාරය විදේශිය සහ දේශිය ගිහි පැවිදි ප්‍රභූන්ගේ උපකාරයෙන් සාර්ථකව ඉදිරියට ඇදී ගිය කාලයක් විය බෞද්ධයාට ඉංග්‍රිසි රජයෙන් අහිමි කළ ආගමික සහනතාවය සහ සාධරණත්වය ලබා ගැනිමට දියත් කළ බෞද්ධ පුනරුද ව්‍යාපාරය තුළින් ආගමික සහ ජාතික පිබිදීමක් ඇති වී බෞද්ධ පාසල් පිහිටුවීම බෞද්ධ කොඩියක් නිර්මාණය කිරීම අලුත් අවුරුදු නිවාඩුව ලබා ගැනිම බෞද්ධ විවාහ සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් අනුමත කිරීම යන වැදගත් ජයග්‍රහණ ලබා සිටි අවධියක් වී තවද මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් ක්‍රිස්තියානිනට විරුද්ධව වාද පහක් කර ජයග්‍රාහිව සිටි කාලයක් වී ක්‍රිස්තියානි කතිකිස්ම පොත්වලට පිළිතුරු ලෙස බෞද්ධ කථෝපතන ලියු කාලයක් විය බෞද්ධ පතපොත ප්‍රචලිත වු අවධියක් වී

## මෙත්තානන්ද

## බුද්ධාගම හා සංස්කෘතිය

මෙත්තානන්ද මහතා මෙරටේ නුතන බෞද්ධ පුනරුදයේ පතාක යෝධයෙක් බව අවිවාදයෙන් පිළිගැනේ. දහනම වැනි සියවසේ බෞද්ධ පුනරුදයක් ඇතිවුවත් මෙරටේ බෞද්ධ විරෝධි සහ සංස්කෘතික විරෝධි බලවේග සම්පූර්ණයෙන් මුලිනුපුටා දැමිය නොහැකි විය. මේ හේතුවෙන් විසිවැනි සියවසේ මුල භාගයේ අනගාරික ධර්මපාලතුමාට සිංහලයන් අවදි කිරීමටත් බෞද්ධයන් නගාසිටුවීමටත් ඉමහත් උත්සාහයක් කිරීමට සිදුවී ලංකාවේ තෙවැනි බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නිර්මාතෘ වුද මහාබෝධි සමාගම පිහිටුවා බුද්ධාගමේ සහ බෞද්ධ සංස්කෘතියේ නවෝදය සඳහා ක්‍රියා කළා වුද අනගාරික ධර්මපාලතුමා 1933 අප්‍රේල් මස 29 වන දින අභාවප්‍රාප්ත වීම මෙරටේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයට වැදුණු මරුපහරක් විය මෙම නොදැරිය හැකි පාඩුවෙන් මෙරටේ බුද්ධාගම සහ සංස්කෘතියේ පුනරුදයකට ජිවිතය කැපකළ මෙත්තානන්ද මහතා එක් අතකින් අනගාරික ධර්මපාලතුමාට මෙන් රිදී සිනු කටහඩක් නොතිබුණත් බුද්ධාගමට සහ සංස්කෘතියට තමා තුළ වී අකලංක භක්ත්‍යාදරය හේතුකොට ගෙන ගැඹුරු චින්තනයක් සහ කටහඩක් උරුම වීමෙන් මෙත්තානන්දයන්හට නුතන ලංකාවේ බෞද්ධ පුනරුද ව්‍යාපාරය හුදෙකලාව වුවද ගෙනයාමට ශක්තියක් තිබුණි. බුද්ධාගම සහ බෞද්ධ සංස්කෘතිය පිළිබඳ නුතන යුගයේ අති විශිෂ්ට සේවාවක් කළ සිල්වත් හා ගුණවත් පැලැනේ ශ්‍රී වජිරාඥාණ මහ නාහිමියන් ක්‍රි. වර්ෂ 1955 සැප්තැම්බර් මස 21 වන දින අපවත්වීම මෙරටට නොදැරිය හැකි පාඩුවක් විය. එහෙත් ඉන් නොසැලුණු මෙත්තානන්ද මහතා මෙරටේ බෞද්ධ හිතෛෂි ප්‍රභූන් සහ සිල්වත් ගුණවත් සංඝ පිතෘවරයන් කිපදෙනෙකු හවුල් කරගෙන ධර්මපාලතුමා නැවතු තැන සිට බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඉදිරියටම ගෙන ගියේය.

*මෙත්තානන්ද මහතා ගාල්ලේ පැවති සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සැසිවාරයේදී සභාපති ධුරයට පත් කෙරිණි.* මේ අවස්ථාවේදී එතුමා ප්‍රකාශ කළේ තමා කිසිදු ආගමකට විරුද්‍ධ නොවන බවයි තමා ධනවාදය කොමියුනිස්ට්වාදය සහ අධිරාජ්‍යවාදය හෙළාදකින බව එම බෞද්ධ සම්මේලනයේදී ප්‍රකාශ කෙරිණි. ගාල්ලේ සැසිවාරය අමතා අපේ ආගමේ චිරස්ථියට හේතුවන ඉතාමත් උත්කෘෂ්ඨ ක්‍රියා සංතතිය නම් බෞද්ධ අධ්‍යාපනය බවත් අපරාධවලට ප්‍රධාන හේතුව දුප්පත්කම සහ නුගත් කම බවත් ප්‍රකාශ කළේය. අපරාධ වැළැක්වීමට හොඳ ප්‍රතිකාර භාමත් වන ශරීරයටත් භාමත් වන මොළයටත් ආහාර දිම වේ සදාචාර සම්පන්න ගුණගරුක ජාත්‍යාලය ඇති වැසියන් පිරිසක් මෙරටේ ඇති කිරීම ඔහුගේ පරම අධ්‍යාශය විය. සමහරු එතුමා ආගම් පිස්සා යන විරුද නාමයෙන් හැඳින්වුවත් කිසි දිනක අන්‍ය ආගම්වලට නොගැරහිය. බෞද්ධ පුනරුද ව්‍යාපාරයක් ඇති කිරීමෙන් ඔහු අපේක්ෂා කළේ බුද්ධාගමට සහ බෞද්ධයනට නැතිවී ගිය අයිතිවාසිකම් නැවත ලබා ගැනිමය. 1815 උඩරට ගිවිසුමේ පස්වැනි වගන්තියෙන් බ්‍රිතාන්‍ය රජය බුද්ධාගම නොකඩවා ආරක්ෂා කිරීමට වු පොරොන්දුව යළි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කළයුතු යැයි මොරගා කිය. ක්‍රි. වර්ෂ 1818 නොවැම්බර් මස 21 වැනි දින කරන ලද ප්‍රකාශනයට අනුව අන්‍ය ආගමික නිකායවලට ලබා දී ඇති ඉඩකඩම් පිළිබඳව නිතිය නිතයානුකූලව ක්‍රියා කිරීමට ඉල්ලිය ඒ අතර කතෝලික පල්ලිය සතු ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම් බෞද්ධ විහාරගම් පාලනය කරන අයුරින් කළයුතු බව පෙන්වා දුනි. 1947 ආණ්ඩුක්‍රමයේ 29 (2) වගන්තිය අවලංගු කිරීමත් පොහොය සතර ප්‍රසිද්ධ නිවාඩු දින කිරීමත් ඉල්ලා සිටින ලදි. ත්‍රිපිටකය සිංහල භාෂාවෙන් මුද්‍රණය කිරීමටද රජයෙන් ඉල්ලි.

බෞද්ධ සම්මේලනය විසින් 1950 ගණන්වල අතහැර දැමු ආගමික සටන නැවත දියත් කිරීමට මෙත්තානන්ද බෞද්ධ ජාතික බලවේගය නැමැති ව්‍යාපාරයක් පිහිටුවා ගත්තේය. මෙම ව්‍යාපාරයට තරුණයින් බඳවා ගෙන ඉංග්‍රිසි නොදන්නා දුප්පත් අසරණ අහිංසක ජනතාවගේ ප්‍රශ්න නිරාකරණය කරදීම සඳහා යකා සමඟ හෝ එක්වීමට හේ තිරණය කළේය. එකල රටේ ගොඩනැගෙමින් තිබුණ සංස්කෘතිය තුප්පහි සංස්කෘතියක් ලෙසත් සමහර බෞද්ධයන් තෙම්පරාදු බෞද්ධයන් ලෙසත් හංවඩු ගැසිණි හෙතෙම අමදැප සටනද දියත් කළේය.

1953 දෙසැම්බර් මස 27 වන දින කෑගල්ලේ පැවති සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ සැසිවාරයේදී බෞද්ධ තොරතුරු පරීක්‍ෂක සභාවක් පත් කර ගැනිමට සමත් වී. මෙම පරීක්‍ෂණ සභාවට බෞද්ධ අධ්‍යාපනය බෞද්ධ විහාර දේවාල ඉඩම් සිංහල භාෂාව යන විෂයයන් අධ්‍යයනය කිරීමට පැවරිණි. මෙම කොමිෂන් සභා වාර්තාවේ බෞද්ධ අධ්‍යාපනය නැමැති පරිච්ඡේදය ලියන ලද්දේ මෙත්තානන්ද මහතා විසිනි. මෙම පරීක්‍ෂණ සභාවේ පුජ්‍ය අඹන්වැල්ලේ සිද්ධාර්ථ හාලියාලේ සුමනතිස්ස පොලොන්නරුවේ විමලධම්ම ආනන්ද මෛත්‍රිව ශ්‍රී ඥාණාලෝක කොටහේනේ පඤ්ඤාකිර්ති මඩිහේ පඤ්ඤාසිහ යන ස්වාමින් වහන්සේලාත්, ජී පී මලලසේකර, පි. ද ඇස් කුලරත්න, එල්. එච්. මෙත්තානන්ද, ඩී. සී. විජයවර්ධන, තෙන්නකෝන් විමලානන්ද, සි. ඩී. එස්. සිරිවර්ධන, ටී. බී. ගොඩමුන, එම්. ටී. යූ. ද සිල්වා, එම්. ඩී. සී. අබේරත්න යන මහත්වරුත් ක්‍රියා කළහ. 1956 පෙබරවාරි මස 04 වැනි දින තමා විදුහල්පති තනතුරු දැරූ ආනන්ද විදුහලේදී බෞද්ධ තොරතුරු පරීක්‍ෂක සභාවේ වාර්තාව පිළිගැන්විණි එපමණක් නොව මෙම වාර්තාවේ යෝජනා රජයට පිළිගන්වා ඒවා ක්‍රියාගත කිරීමට බල කෙරිණි

බෞද්ධ ජාතික බලවේගය තුළින් මෙරටේ බෞද්ධයන්ගේ අයිතිවාසිකම් මොනවාද? එම අයිතිවාසිකම් නැතිවී ගොස් ඇති ආකාරයද සංඛ්‍යාලේඛන ආශ්‍රයෙන් පෙන්වා දුනි එවකට මෙරටේ තිබුණු පුවත්පත් කිපයක් බුද්ධාගමට සහ බෞද්ධයනට පහරපිට පහරදෙද්දී මෙත්තානන්ද පුවත්පත් කොමිෂමක් ඉල්ලා උද්ඝෝෂණය කෙරිණි මෙසේ පත් කළ පුවත්පත් කොමිසම ඉදිරියේ සාක්‍ෂි දුන් මෙත්තානන්ද පුවත්පත් නිදහස් තිබිය යුතු බවත් වගකිමෙන් කටයුතු කිරීම ජාතික පුවත්පතක කාර්‍යයක් විය යුතු බවත් පෙන්වී. නිදහස් පුවත් පත් මණ්ඩලයක් පිහිටුවීමට යෝජනා කළේ එහෙයිනි. අසැබි පතපොත තහනම් කිරීමටත්, සුරාසුදුව නැවතිමටත්, බෞද්ධ ජාතික බලවේගය ඇපකැප වී මෙරටේ තුප්පහියන් යනු පියාගේ බීර බෝතලේ පුතා බොන සිගරට්ටුව උරන බිරිඳ අන්සැමියෙකු පතන පිය දුවණි ආලිංගන නැටුමේ යෙදෙන අය ලෙස පෙන්වා දුන්නේය.

## මාසික මාධ්‍ය චාරිකාව

සැම මාසයකට ම වරක් බෞද්ධ පුජනිය ස්ථානයකට මාධ්‍ය චාරිකාවක් (එක් දින හො දෙදින) බෞද්ධාලෝකය පුවත්පත මගින් සංවිධානය කර තිබේ. මෙහි දී එකි ස්ථාන පිළිබඳව ගවේශනයක් හා මාධ්‍ය වාර්තාවක් සම්පාදනය කරනු ලබන අතර චිත්‍රණ සැකැසිම ද සිදු කිරීම විශේෂත්වයක් වනු ඇත. මේ සඳහා ඉතා සිමිත පිරිසක් පමණක් සම්බන්ධ කරගන්නා බැවින් ඔබේ ඉල්ලුම් පත හැකි ඉක්මනින් පහත ලිපිනයට එවන්න.

බෞද්ධාලෝකය මාධ්‍ය චාරිකා,
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.